කෙටි කතාව

# ''වැටත් නියරත් ගොයම් කා නම්....''

අසේල දේවේන්ද්‍ර

''ගුඩ් මෝනින් සර්....''

නිල රථයේ පසුපස දොර විවෘත කල ආරක්ෂක නිලධාරියාගේ ආචාරයෙන් තිගැස්සි පියවි ලොවට පැමිණි තිලකසිරි සීරුවෙන් රථයෙන් බැස අමාත්‍යාංශ ගොඩනැගිල්ලට පිවිසියේය. වෙනදා මෙන්ම තමාට වෙන් කර ඇති විදුලි සෝපානය වෙත ඇවිද ගිය ඔහු ආචාර කරන නිලධාරීන්ට හිස යම්තමින් සොලවා ප්‍රතිආචාර කළේය.
ආධුනික පුහුණු කාලයේදී තිලකසිරිගේ ප්‍රධානියා වු අතිරේක ලේකම් ජයවර්ධනගෙන් සුලු නිලධාරීන්ට හා අනෙකුත් සේවකයන්ට මෙසේ ආචාරය කරන අයුරු ඉගෙන ගත් සැටි ඔහුට සිහිවිය.
විදුලි සෝපානයට ඇවිදගෙන යන අතර අනෙක් සෝපානයේ යෑමට පෝලිමේ සිටින පිරිස දෙස නොබැලීමට ඔහු නිතරම ප්‍රවේශම් විය. විදුලි සෝපානයට ඇතුලු වු තිලකසිරි තමාගේ බ්‍රීෆ්කේස් එක ඔසවා ගෙන කඩිනමින් පඩිපෙල නගින කාර්යාල සේවක පියදාස දුටුවේය.

''ඇමතිතුමා අද කලින්ම ඇවිල්ලා වගේ'' ඇමතිගේ ආරක්ෂක භටයන් දුටු තිලකසිරි අසලට පැමිණි අතිරේක ලේකම් සිරිවීරට'' පැවසුවේය.
''ඔව් සර්, ඊයේ පාර්ලිමේන්තුවේදී හොඳටම සවුත්තු වෙලා තරහින් පුපුර පුපුර ආවේ.''

''මගේ ප්ලෑන් එක හරියටම වැඩ කරලා වගේ'' තිලකසිරි සිතුවේ ඉමහත් සතුටිනි. ඊයේ පැවති අමාත්‍යාංශ තේරීම් කාරක සභා රැස්වීමට තිලකසිරි සමඟ නොගොස් නියෝජ්‍ය ලේකම් ගුණරත්න සමග යෑමට ඇමති සුදානම් වන ආරංචිය ලැබුනු විට තමන් මහත් සේ කෝපවූ අයුරු තිලකසිරිට සිහිවිය. පසුගිය ඇමති මාරුව වූ විගසම ගුණරත්න තම බිරිඳගේ දුර නෑකමක් සොයාගෙන අලුත් ඇමති පසුපස ගොස් නියෝජ්‍ය ලේකම් ධුරයකට උසස් විය. මුල සිටම තිලකසිරිගේ විරුද්ධවාදියෙක් වු ගුණරත්න ඉතා ඉක්මණින්ම ඇමතිගේ ප්‍රධාන එක් ගෝලයකු විය. ඔහු නිතරම කේලම් කියා ඇමතිගේ සිත තමා කෙරෙහි බිඳවීමට තැත් කරන බවද තිලකසිරි හොඳින් දැන සිටියේය. ''මම ඕක වෙන බව මුලින්ම දන්නවා. ඊයේ පෙරේදා උඩට නැගපු ගුණරත්නට පුළුවන්ද ඕවට මූන දෙන්න. ඇමතිතුමාටත් හොඳ වැඩේ උඩ පැනගෙන මිනිහව එක්ක ගියාට.'' අතීත ආවර්ජනයෙන් ගැලවුනු තිලකසිරි සිරිවීරට පැවසුවේය.

තම පාසල් මිතුරෙකු වු දැන් විරුද්ධ පක්ෂයේ වාමාංශික මන්ත්‍රීවරයෙකු වන සේනාධීර හමුවී පාර්ලිමේන්තු කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශය පිළිබඳව ඇසිය යුතු ප්‍රශ්න තමා පැවසු බව කිසි කෙනෙකු දන්නේ නැත. ගොඩනැගිලි ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී තම හිත මිතුරන්ට ඒවා ලබාදීමට ඇමති ක්‍රියාකල අන්දම ලිපි ගොනු සමගම තිලකසිරි සේනාධීරට විස්තර කළේය.
පසුගිය රජයේ නියෝජ්‍ය ඇමති කෙනෙකු වු සේනාධීර එවකට නියෝජ්‍ය ලේකම් වරයෙකු වු තිලකසිරි කල උදව් කිසිදිනෙක අමතක කළේ නැත.

''හොඳ වැඩේ ඇමතියාට, ජපෑන් ටුවර් එකෙන් මාව කපල දාලා ගුණරත්නව දා ගත්තට.''
''ලැජ්ජා නැති මිනිස්සු සර්.'' සිරිවීර පැවසීය.

මෙම ජපාන සංචාරයට යෑමට මුලින්ම සුදානම් වුයේ හිටපු ඇමතිතුමා සහ තිලකසිරිය. තිලකසිරිගේ බිරිඳ නිර්මාලී මෙය දැනගත් දා සිට සංචාරයට සැරසුනේ ඉමහත් සතුටිනි. තිලකසිරි සමග ලෝකය පුරාම සංචාරය කර ඇති මුත් ඇය කිසි දිනෙක ජපානයට ගොස් නැත. ජපානයෙන් ගෙන ආයුතු ලැයිස්තුව සති ගණනක් වෙහෙස වී ඇය පිළියෙල කළාය. සංචාරය සංවිධානය කළ දේශීය ඒජන්සි සමාගම එම ලැයිස්තුව ජපාන සමාගමට යැවුවේ මාස දෙකකටත් කලින්ය. එහෙත් අවසාන මොහොතේ ගුණරත්නගේ කීම අසා අලුත් ඇමති තිලකසිරිව කපා හැර ගුණරත්න සමග යෑමට සුදානම් විය. මෙම ආරංචිය දැනගත් නිර්මලී දින ගණනාවක්ම ශෝකයෙන් තැවුණාය.
අමාත්‍යාංශයෙන් අමාත්‍යාංශයට තිලකසිරි සමග මාරු වී පැමිණි සිරිවීර කවදත් තිලකසිරිට හිතවත් විය. කාර්යාලයේ වෙන සෑම සිදුවීමක්ම ගැනම දන්නා සිරිවිර, තිලකසිරිට සියලු ආරංචි පවසයි. ජපාන සංචාරයෙන් තිලකසිරිගේ නම කැපුනු බව සියල්ලන්ටම කලින් සිරිවීර දැන ගත්තේය. ලිපිකරුවන්, කාර්යාල සහායකයන් සමඟ ඉතා කුලුපගු සිරිවීරට නොදැනුවත්ව කිසිදෙයක් සිදුනොවේ. තම සුවපහසු අසුනේ වාඩිගත් තිලකසිරි තමා වෙත පිරිනැමු තේ කෝප්පයෙන් උගුරක් පානය කළේය. මේසය මත වු එංගලන්තයේ සෑදු වටිනා තේ කට්ටලය දුටු ඔහුට පසුගිය යුරෝපා සංචාරය සිහිවිය. නව අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ විදුලි සේපාන



සිතුවම - සුනිල් කුමාර අමරකෝන්

සවිකල ස්විඩන සමාගම නඩත්තු පුහුණුව සඳහා කාර්මිකයන් දෙදෙනෙකු ස්වීඩනයට එවන ලෙස දැන්වු විට, එවැනි රටක සංචාරයක් සුලු සේවකයන්ට දීම නුසුදුසු යැයි තීරණය කළ තිලකසිරි තවත් ලේකම්වරයෙකු සමග එම පුහුණුවට ගියේය. තමන්ට මේ පිළිබඳව කිසිදු දැනීමක් නැති බව දැනගත් පුහුණු නිලධාරීන් කෝප වී බැණ වැදුනු අයුරු තිලකසිරිට සිහිපත් විය.
''ගාන ලැබෙනවා නම් උන්ට මොකද කවුරු ආවත්'' තිලකසිරි තමාටම කියා ගත්තේය.

පසුව දේශිය නියෝජිත සමාගම මැදිහත් වී පුහුණුව නවතා දෙදෙනාටම මාසයක යුරෝප සංචාරයක් පිළියෙල කළේය. ඒ වෙනුවට විදුලි සෝපාන නඩත්තුව අවුරුදු පහකට දේශීය සමාගමට දීමට තිලකසිරි පොරොන්දු විය. මෙය දැනගත් ගුණරත්න කලින් සිටි ඇමති දිසානායක

*තිලකසිරිගේ අවුරද්දේම ශිෂ්‍යයාවක වු සන්ධ්‍යා විශ්වවිද්‍යාලයේ ජනප්‍රිය චරිතයක් වුවාය.*

උසිගන්වා තිලකසිරිට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්වීමට සුදානම් විය.

''සන්ධ්‍යා පිහිටවුන නිසා එදා යාම්තම් බේරුනා.'' තිලකසිරිට ඉබේම සිනා පහල විය. තිලකසිරි සමග කාර්යාලයට පැමිණි සිරිවීර මවිතයෙන් ඔහු දෙස බැලුවේය.

''සර් ගුණරත්නයා තාම ඇවිල්ලා නෑ. ආවහම තමයි ගිනිකෙලි බලන්න පුලුවන්.'' සිරිවීර පවසනු තිලකසිරිට ඇසුනේ යම්තමිනි. ඇමති දිසානායක වැනි අමනයෙකුගේ අනියම් බිරිඳ වීමට සන්ධ්‍යාට සිදුවුයේ මන්දැයි තිලකසිරිට සිතුනේ වරක් දෙවරක් පමනක් නොවේ.

තිලකසිරිගේ අවුරද්දේම ශිෂ්‍යයාවක වු සන්ධ්‍යා විශ්වවිද්‍යාලයේ ජනප්‍රිය චරිතයක් වුවාය. ගී ගැයීමට මෙන්ම ක්‍රීඩාවට ද දක්ෂ ඇය දිවයිනේ ප්‍රසිද්ධ පුද්ගලික බාලිකා විදුහලකින් විශ්ව විද්‍යාලයට ඇතුලු වු කෙනෙකි. පාසැල් වියේදී හඳුනාගත් කෙනෙකු සමග පෙමින් බැඳී සිටි ඇය, තිලකසිරිද ඇතුලුව සිසුන් කිහිපදෙනෙක්ම කළ යෝජනා ප්‍රතික්ෂේප කලේ ඉතා නිහතමානිවය. ආර්ථික විද්‍යා විෂයට සමත්කමක් දැක්වු තිලකසිරි පළමු වසරේ සිටම අනෙකුත් සිසුන්ට විශේෂයෙන්ම සිසුවියන්ට නිබන්ධන කිරීමට උදව් කළේය. සවස ශිෂ්‍ය කේන්ද්‍රයට සිසුන් සමග එකතු වී රෑ බෝවනතුරු පාඩම් කල තිලකසිරි සමකාලීනයන් අතර දීප්තිමත් ශිෂ්‍යයෙකු විය. එකල සන්ධ්‍යාද මේ කණ්ඩායමේ විය.
ඊළඟ වසරේ ඇතුළු වු ශිෂ්‍යයන්ට ද තිලකසිරි උදව් කළේය. දෙවන වරයේදී නිබන්ධන අසා ගැනීමට පැමිණි නිර්මාලී තම පෙම්වතිය වූ පසු අනෙක් අයට පාඩම් කියාදීම ඉබේම නතර විය.
''නිර්මලී කැමති වුනේ නෑනේ අනෙක් ගැහැනු ළමයින්ට උදව් කරනවාට.''
තිලකසිරි ශිෂ්‍යාවන්ට සමීප වී පාඩම් කියාදෙන විට ඇයගේ මුහුණ පුලුටු වන අයුරු ඔහුට සිහිවිය. සරසවියෙන් පිටවු පසු සන්ධ්‍යා මුණ ගැසුනේ කිහිපවරක් පමණක් වුවද, ඇය පෙර පරිදිම මිත්‍රශිලීව හැසිරුණාය. තිලකසිරිට විරුද්ධව පැවැති විනය පරීක්ෂණය ඇරඹීමට පෙර සන්ධ්‍යා හමුවු අයුරුත්, ඇය උදව් කිරීමට පොරොන්දු වු අයුරුත් තිලකසිරි කෘතඥපූර්වකව මෙනෙහි කලේය.

''අනෙක් පරයෝ වගේ නෙවේ. කරපු උදව් අමතක කරන්නේ නැති කෙනෙක් සන්ධ්‍යා.''' විනය පරීක්ෂණය ඉබේම යටගිය පසු ඔහු සන්ධ්‍යා හමුවී ස්තූති කළේ මුලු හිතින්මය.
එකම පක්ෂයේ වුවත් ඇමති දිසානායක හා අලුත් ඇමති ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් දෙකක විය. නිරතුරුවම පක්ෂය තුළ ඇණ කොටාගත් ඔවුන් මඳ අවසරයක් ලද තැන ජනාධිපති හමුවී එකිනෙකාට විරුද්ධව කේලම් කීහ. කලක් ඇමති දිසානායක සමග ඉතා කුලුපගුව සිටි ගුණරත්න අලුත් ඇමති පත්වූ විගස ඔහු සමග එකතු වී දිසානායක ඇමතිට විරුද්ධව ජනාධිපතිට පැමිණිලි කිරීමට අවශ්‍ය තොරතුරු සොයා දුන්නේය. දිසානායක ඇමතිගේ මස්සිනාට ලබාදුන් ටෙන්ඩර්ද ඒ අතර විය.

වසර 3-4 කට වරක් පවත්වන සිවිල් සේවයේ සමකාලීනයන්ගේ පසුගිය සාදයට සන්ධ්‍යාටද ආරාධනා කිරීමට සංවිධායකයෙකු වු තිලකසිරි කටයුතු කලේ යටි අදහසක්ද ඇතුවය. සිවිල් සේවයේ නොයෙදුනු සන්ධ්‍යාට ආරාධනා කිරීම ගන සමහරක් අකමැත්ත පල කලත්, ඇය ඉන්නා ප්‍රබල තත්ත්වය දන්නා බැවින් තදින් විරුද්ධ වුයේ නැත. ඇයට ආරාධනා කිරීමට මුල් වුයේ තිලකසිරි බව දැනගත් සන්ධ්‍යා, ඔහු සමග බොහෝ වේලාවක් කතා කරමින් සිටියාය. පක්ෂයේ ප්‍රබලයන් සමග සමීපව ආශ්‍රය කරන සන්ධ්‍යා ලවා අලුත් ඇමතිගේ දුෂණ ක්‍රියාවන් මුල් පුටුවලට දන්වා යැවීමට තිලකසිරි සමත් විය. ඉන්පසු පැවැති පක්ෂ රැස්විමකදී විරුද්ධ කණ්ඩායමේ චෝදනා ඉදිරියේ අලුත් ඇමති දුර්මුඛව සිටි බවත්, ජනාධිපතිගේ දෝෂාරෝපණයට ලක්වූ බවත් තිලකසිරි දැන ගත්තේ සිරිවිරගෙනි.
ගුණරත්නගේ එදිරිවාදිකම් නොඉවසු තිලකසිරි ගමන් වියදම් දීමනා සම්බන්ධයෙන් ඔහුට විරුද්දව පරීක්ෂණයක් ගොනු කලත් ඇමතිගේ බලපෑම නිසා ක්‍රියාත්මක කල නොහැකි විය. එහෙත් ඊයේ වු සිද්ධියෙන් පසු ගුණරත්න කැපෙන බව ස්ථිර නිසා නැවතත් පරීක්ෂණය ආරම්භ කිරීමට තිලකසිරි සිතා ගත්තේය.
''මේ පාර නම් ගුණරත්නයාගේ කෙරුම් ඉවරයි.'' තිලකසිරි මහත් සතුටින් තමන්ටම කියා ගත්තේය.

''සර්, සර් හරි වැඩේ ඇමතිතුමා අයින් කරලා.'' ඉතා කලබලයෙන් කාමරයට කඩා වැදුනු නියෝජ්‍ය ලේකම් ප්‍රනාන්දු හතිදමමින් පැවසුවේය.
''ඊයේ වැඩේට ජනාධිපතිට හොඳටම තරහ ගිහින් ආපහු දිසානායක ඇමතිතුමාව පත් කරලා.''

සිතේ ඇති වූ ප්‍රීතිය පිටට නොපෙන්වීමට වගබලා ගත් තිලකසිරි ඒ සමගම පැමිණි සිරිවීරගෙන් සියලු විස්තර අසා ගත්තේය. සුවපහසු ලෙස හරිබරි ගැසී අසුනේ වාඩි වු ඔහු දුරකතනයෙන් අංක එබුවේ එදෙස නොබලාමය.

''ජැපෑන් යන්න ලෑස්ති වෙන්න නිර්මාලී.'' දුරකතනය පහත හෙලා සැනසුම් සුසුමකින් ලය සැහැල්ලු කරගත් තිලකසිරි නිර්මලීගේ සතුටින් ඉපිල ගිය මුහුණ සිතින් මවා ගත්තේය.

■

